# වැලිතලප

**ජී.ඒ.ආර්.කේ.ගම්ලත්**
ජ්‍යෙෂ්ඨ පරිසර නිලධාරි
උතුරු මැද පලාත් කාර්යාලය / මධ්‍යම පරිසර අධිකාරිය



රසකැවිලි අතරින් වැලිතලප වලට හිමිවන්නේ ප්‍රධාන ස්ථානයකි. නෑගම් ගෙනයාම සඳහාත්,දාන මානාදියේදී අවුල්පතක් ලෙසත්,සිංහල අලුත් අවුරුදු කෑම මේසය සරසන රස කැවිල්ලක් ලෙසත් වැලිතලප ප්‍රසිද්ධය.

පිට්ටු මල් කිරීම, කඩපිම්මේ තැම්බීම,ලනු වැටෙන පදමට පැණි රත්කර ගැනීම වැනි වැලි තලප සැකසීමේ කාර්ය හා සම්බන්ධ වාග් මාලාවක්ද ඇත. වැලිතප සඳහා ගම්මිරිස් හා දුරු වර්ග එක්කරන බැවින් එය ඖෂධීය ගුණයක් සහිත රස කැවිල්ලක් ලෙසද හඳුන්වයි.

ආචාර්ය ජයලත් මනෝරත්න ශූරීන්ගේ "ගුරුතරුව" වේදිකා නාට්‍යයේ ඇතුලත් වැලිතලප ගැන කියැවෙන ඔදානිස් ගුරුන්නාන්සේ රචනා කරන ලද මෙම පැදි පෙළ රසකැවිලි පිළිබඳ අපේ උරුමය කියාපාන අවස්ථාවකි.

1. කැකුළු සහල් පිටියෙන්ද
   වටකර ඔලු ඇට මෙන්ද
   තම්බා කඩපිම්මෙන්ද
   සුරැකිව තබා යෙහෙන්

2. එකිතුල් පැණි හකුරෙන්ද
   මදක් සීනි සමගින්ද
   හැඳිගා කකාරමින්ද
   ලනු වැටෙනා පදමින්

3. තිවග දෙදුරු සමගින්ද
   එක එක පමණ යසින්ද
   බැද සුන්කර ගනිමින්ද
   එකතුව සෑම දෙසින්

4. බඳුනක ලා සතොසින්ද
   සමකර යස විලසින්ද
   එදවස පසුව ගොසින්ද
   ගනිමින් නැවත තොසින්

5. කැබලිව සැතින් කපාම
   රඹ කැන් සමග කදීම
   ලොව සතහට සොඳ කෑම
   අසනුය නැනැති සියල්

6. උදය උදය සැමදාම
   වළඳා උණු පැන් බීම
   සත සිත් පෙර පිනවාම
   මියුරු දෙයකි සුවිපුල්

7. වැලි තලපය යන නාම
   පැවසුවෙ පෙර දුරු සෑම
   වාපිත් සමන කිරීම
   කදිමට වේ නිරවුල්

> උපුටා ගැනීම: ආචාර්ය ජයලත් මනෝරත්න ශූරීන්ගේ ගුරු තරුව වේදිකා නාට්‍යයෙන්.